# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
# පෙරදිග සංගීතය

**10 ශ්‍රේණිය – 2019 – I වාරය** **කාලය පැය 03**

## I කොටස

- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හා වඩාත් ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. | නිස ග ම | ධ ම ධ නි | සං - සං - |ගං ගං රිං සං| යනුවෙන අන්තරා කොටස ආරම්භ වන්නේ,
   (1)භෛරවි රාගයේ සර්ගම් ගීතයේ ය (2)භෛරවි රාගයේ මධ්‍යලය ගීතයේ ය
   (3)කාෆි රාගයේ සර්ගම් ගීතයේ ය (4)භූපාලි රාගයේ මධ්‍යලය ගීතයේ ය

2. යමන් හා භෛරවි යන රාග දෙකෙහි සමාන වන්නේ,
   (1) ජාතියයි (2)මේලයයි (3)වාදී ස්වරයයි (4)මුඛ්‍යාංගයයි

3. පහත ප්‍රකාශ වලින් විස්තර කරන ගායන ශෛලීය කුමක්ද?
   - ස්වර ඥානය හා රාග ඥානය වර්ධනය වීමට උපකාරී වේ.
   - රාග සංගති අන්තර්ගතය.
   - ස්වර වලින් පමණක් නිර්මාණය වී ඇත.

   (1)ලක්ෂණ ගී (2)මධ්‍යලය ගී (3)සර්ගම් (4)ඛ්‍යාල්

4. භෛරවි රාග ආශ්‍රිතව තනු නිර්මාණය කොට නොමැති ගීතයක් වන්නේ,
   (1)කවාලා විළඳ ජාතී (2)පාරමිතා බල පුරිත
   (3)මහ බෝධි මූලේ (4)මන්නාරම් පිටිවැල්ලේ මදුටිය වැල්

5. කිසියම් රාගයකට අනන්‍ය වූ ලක්ෂණ ඇතුලත් කරමින් තාලයකට අනුගතව ප්‍රබන්ධ කර ඇති ගීත,
   (1)මධ්‍යලය ගීත (2)ලක්ෂණ ගීත (3) විලම්භලය ගීත (4)සර්ගම් ගීත

6. මේලයකට අයත්වන නමුත් රාගයේ දී නොයෙදෙන ස්වර,
   (1)වර්ජිත ස්වරවේ (2)විවාදී ස්වරවේ (3)සංවාදි ස්වරවේ (4)අනවාදි ස්වරවේ

7. ආරෝහණයේ හා අවරෝහණයේ යෙදෙන ස්වර සංඛ්‍යාව අනුව තීරණය වන්නේ රාගයක,
   (1)වාදී ස්වරයයි (2)මුඛාංගයයි (3)ගානසමයයි (4)ජාතියයි

8. සරිගමගරිගප ... යන ස්වර සංගතිය අයත් වන්නේ,
   (1)බිලාවල් රාගයටය (2) භූපාලි රාගයටය (3) යමන් රාගයටය (4)කාෆි රාගයටය

9. නිස ගු රි ස ,නි ස ගු ම ගු රි ස ........ ඊළඟට යෙදෙන ස්වර පාදය වන්නේ,
   (1)නි ස ගු ම ප ධ නි ස (2)නිසගුමපමගුරිස (3)නිසගුමපධනිධපමගුරිස (4)නිසගුමපධපමගුරිස

10. ස රි ග ම ප ධ නි සං යන ස්වර භෛරවි රාගයට අදාල ව සකස් කිරීමේ දී,
    (1) ම ස්වරය තීව්‍ර කළයුතුය (2) ග නි ස්වර කෝමල කළයුතුය
    (3) රිගධනි ස්වර කෝමල කළයුතුය (4) රි ධ ස්වර කෝමල කළයුතුය

11. ම,නි ස්වර දෙක පිළිබඳ වඩාත් නිවැරදි කියමන වන්නේ,
    (1)යමන් රාගයේ දී විවාදි ස්වර ලෙස යෙදෙන බව
    (2)බිලාවල් රාගයේ දී වාදී සංවාදී ස්වර ලෙස යෙදෙන බව
    (3)භූපාලිරාගයේ දී නොයෙදෙන ස්වර වන බව
    (4)කාෆි රාගයේ දී වර්ජිත ස්වර වන බව

12. සප්තක තුනම ඇසුරු කර ගත් ස්වර බණ්ඩය තෝරන්න.
(1)ස ග ම ප ධ නි ස්      (2)ප ධ නි ප ධ නි ස්      (3)ප ධ නි ස රි ග ම      (4)ස රි ග ම ප ධ නි ස්

13. සංගීත භාණ්ඩ වර්ගීකරණයන්හි දී තත් වාද්‍ය භාණ්ඩ නොමැති වර්ගීකරණය ඇත්තේ,
(1)පෙරදිග භාණ්ඩ වර්ගීකරණයේ ය      (2)අපරදිග භාණ්ඩ වර්ගීකරණයේ ය
(3)හින්දුස්ථානි භාන්ඩ වර්ගීකරණයේ ය      (4) දේශීය භාණ්ඩ වර්ගීකරණයේ ය

14. නන්දා මාලනී මහත්මිය ගයන "රුක්අත්තන මල මුදුනේ" ගීතය නිර්මාණය සඳහා පාදක වූ වන්නම වූයේ,
(1)උකුසා වන්නමයි      (2)නෛයඩි වන්නමයි      (3)කෝකිල වන්නමයි      (4)හනුමා වන්නමයි

15. දේශීය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණයේ දී විතත වර්ගයට අයත් භාණ්ඩයකි,
(1)දවුල      (2)ගැටබෙරය      (3)පහතරට බෙරය      (4)තම්මැට්ටම

16. පංචතූර්ය වාදන භාණ්ඩ වර්ග වනුයේ,
(1)තත් / විතත / ඝණ / අවනද්ධ /සුෂිර      (2)ආතත / විතත / ඝණ / හොරණෑ / අවනද්ධ
(3)ආතත / විතත / විතතාතත / ඝණ / සුෂිර      (4)වීණා / හොරණෑ / ඝන / අවනද්ධ / සුෂිර

17. තාල රූප දෙකකට ගැයෙන මැද දොහොරාවක් ඇති නූර්ති ගීතය වන්නේ,
(1)ලියමු මේ සිංහල භාෂාවෙන්      (2)ආරණ්‍යයේ ඉන්නා රම්‍යා කතේ
(3)දැක්කොත් පද්මාවතී අලේ      (4)වාසනා දිනේකී මේක පාමු තුටින්

18. "ඈත කඳුකර හිමව් අරණේ" නම් ගීය ඇතුළත් නාට්‍යය වන්නේ,
(1)හුණුවටය      (2)නල දමයන්ති      (3)බෙරහඬ      (4)තාරාවෝ ඉගිලෙති

19. ජන නාද රටා හා නාද මාලා ඇසුරින් W.B.මකුලොලුව මහතා විසින් නිර්මාණය කරනු ලැබූ ගීත නාට්‍යය,
(1)දෙපානෝ      (2)නල දමයන්ති      (3)බෙරහඬ      (4)පේමතෝ ජායතී සෝකෝ

- **පහත දැක්වෙන ගී පද ඇසුරු කර ගනිමින් 20 සිට 23 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.**

A. ඇඳුරු තුමා වන්න මගේ
B. දැක්කොත් පද්මාවතී ආලේ
C. හෙළ ගැඹුරුයි පුත නොබලන්
D. වාසනා දිනේකි මේක පාමු තුටින්

20. නව නාට්‍ය ශෛලියට ඇතුළත් වන ගීතය කුමක්ද?
(1) A      (2) B      (3) C      (4) D

21. ගීත නාට්‍ය ශෛලියට අනුගත වූ ගීතය වන්නේ,
(1) A      (2) B      (3) C      (4) D

22. ශ්‍රී වික්‍රම නූර්තියේ එන ගීතයකි,
(1) A      (2) B      (3) C      (4) D

23. නීතිඥ චාල්ස් ඩයස් ශූරීන් විසින් රචිත නූර්ති ගීතයක් වනුයේ,
(1) A      (2) B      (3) C      (4) D

24. සංගීත ප්‍රසංගයක ගුණාත්මක බව රඳවා ගැනීම සඳහා යොදා නොගන්නා තාක්ෂණික උපකරණයකි,
(1)බෆල් (Baffle)      (2)ඇම්ප්ලිෆයර් (Amplifier)
(3)ස්මාර්ට් ෆෝන් (Smart Phone)      (4)මික්සර් (Mixer)

25. පහත දැක්වෙන බටහිර සංගීත භාණ්ඩ අතරින් පාසල් තූර්ය වාදනය සඳහා යොදා ගනු නොලබන භාණ්ඩ යුගලය වන්නේ,
(1)චෙලෝ-ගලොකන්ස්පීල් (2) කලැරිනට්-සෙක්සෆෝන්
(3)ඕබෝ-ඉයුෆෝනියම් (4)ට්‍රම්පට්-ට්‍රොම්බෝන්

26. නරිබෑණා නාට්‍යයේ ගී තනු හා සංගීතය නිර්මාණය කරන ලද්දේ,
(1)දයානන්ද ගුණවර්ධනයන් විසිනි (2)ලයනල් අල්ගම ශූරීන් විසිනි
(3)ඔස්ටින් මුණසිංහ මහතා විසිනි (4)බන්ධුල ජයවර්ධනයන් විසිනි

27. ඉන්දීය ගසල් ගායනයේ දී, නූර්ති සංගීතයේ දී ද, පැදුරු සාජ්ජවල දී ද බහුලව භාවිතයට ගැයෙන වාදන භාණ්ඩයකි,
(1)බටනලාව (2)වයලීනය (3)තාම්පුරාව (4)සර්පිනාව

28. තාගෝර් තුමාවිසින් නිර්මාණය කරන ලද්දාවූ ගීත විශේෂයකි,
(1)භජන් ගීත (2)හින්දු ගීත (3)රවීන්ද්‍ර ගීත (4)ගසල් ගීත

29. කුණ්ඩල කේසී නාට්‍යයේ නිෂ්පාදකයා කවරෙක් ද?
(1)පී.වැලිකල මයා (2) සෝමදාස ඇල්විටිගල මයා
(3)ගුණසේන ගලප්පත්ති මයා (4)මහගමසේකර මයා

30. කෝමල ඍෂභය හා කෝමල ධෛවතය සඳහා පර්දා නොමැති සංගීත භාණ්ඩ යුගලයකි,
(1)වයලීනය හ ාසිතාරය (2) වයලීන හා ගිටාරය (3)එස්රාජය හ සිතාරය(4)එස්රාජය හා ගිටාරය

31. "වන් නිල්ගෙල නිල් රන්වරලින් තුල් බිගු දැල්ලා" නම් ගීතය ගැයීමේ දී තාල වාදනය සඳහා වඩාත් උචිත තිත් රූපය වන්නේ,
(1)සුළු මැදුම් දෙතිත (2)සුළු මහ දෙතිත (3)මැදුම් මහ දෙතිත (4)මහ මැදුම් දෙතිත

32. කෝඩ්ස්වාදනය සඳහා උචිත සංගීත භාණ්ඩයුගලයකි,
(1)සිතාරය-ගිටාරය (2)වයලීනය-සින්තසයිසරය (3)ගිටාරය-සින්තසයිසරය(4)වයලීනය-සිතාරය

33. බටහිර සංගීතයට (අපරදිග සංගීයට)අනුව වයලීනයේ තත් සුසර කරනුයේ,
(1)ස රි ප ස් ස්වරයන්ටය (2)ම ස ප රි ස්වරයන්ටය (3)ප රි ධ ග ස්වරයන්ටය (4)ප ස ප ස ස්වරයන්ටය

34. $\frac{7}{8}$ තාල රූපයට සමාන හින්දුස්තානි තාල පදය,
(1) ඣප තාලය (2)දීප්චන්දි තාලය (3)කෙහෙර්වා තාලය (4)බෙම්යො තාලය

35. පෙරදිග සංගීත ප්‍රස්තාරකරණයේ දී දැක්වෙන විභාග, බටහිර සංගීතයේ දී භාවිත වන්නේ,
(1) Barනමිනි (2) Short Staff නමිනි (3) Clefනමිනි (4)Ledger Lineනමිනි

36. කෝමල ඍෂභය (රිෂභය) බටහිර සංගීතයේ දී නාමයන් දෙකින් හඳුන්වයි,
(1) $C^{\#}$හා$D^{\#}$ (2) $E^{b}$හා$C^{\#}$ (3) $C^{\#}$හා$D^{b}$ (4) $E^{\#}$හා$D^{b}$

37. Dotted Semebreve Note එකකවටිනාකමමාත්‍රා,
(1)දෙකකි (2)තුනකි (3) හතරකි (4)හයකි

38. මාත්‍රා හතරෙන් හතරට වැයෙන හින්දුස්තානී තාල යුගලයකි,
(1)දාදරා හා ත්‍රිතාල් (2)කෙහෙර්වා හා ත්‍රිතාල්
(3)ලාවනී හා කෙහෙර්වා (4)බෙම්ටෝ හා ඣපතාල්

39. සිතාරයෙ ප්‍රධාන තත සුසර කරනුයේ,
(1)මන්ද්‍ර ම ස්වරයටය (2)මන්ද්‍ර ධ ස්වරයටය (3)උච්ච ස ස්වරයටය (4)මධ්‍ය ස ස්වරයටය

40. විරාම මාත්‍රා බටහිර සංගීතයේ දී හඳුන්වන්නේ,
(1)Rest Notesනමිනි (2) Stemනමිනි (3)Crochetනමිනි(4)Chordsනමිනි

## II කොටස

- **පළමුවනප්‍රශ්ණය ඇතුලුව ප්‍රශ්නපහකටපමණක්පිළිතුරු සපයන්න.**

01. A සිට J දක්වා ඇති කරුණු ඉදිරිපත් කොට පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න. එම කරුණු වලටඅදාළ රාග විස්තර අනුව රාගයේ නම සඳහන්කර ඉංග්‍රීසි අකුරු වලින් පමණක් වගුව පුරවන්න. (මෙම වගුව පිළිතුරු පත්‍රයේ සටහන් කර ගන්න.)

A. සම්පූර්ණ ජාතී රාගයකි
B. ග හානිවාදී සංවාදී වේ
C. ම හා ස වාදී සංවාදිවේ
D. සම්පූර්ණ ජාතී රාගයකි
E. ස රි ග ම ප ධ නි ස් / ස් නි ධ ප ම ග රි ස
F. කල්‍යාණ ථාටයෙන්ඉපිදේ
G. ස රි ග ම් ප ධ නි ස් / ස් නි ධ ප ම් ග රි ස
H. භෛරවි ථාටයෙන්ඉපිදේ
I. රාත්‍රී ප්‍රථම ප්‍රහාරයෙහි ගැයේ
J. දිනයේ පළමු ප්‍රහාරයෙහි ගැයේ

| රාගය | ථාටය | ආරෝහණ/අවරෝහණ | ජාතිය | වාදි/සංවාදි | ගායනසමය |
|---|---|---|---|---|---|
| ................ | (1) | (2) | (3) | (4) | (5) |
| ................ | (6) | (7) | (8) | (9) | (10) |

(ල:12)

02. (1) ඖඩව ඖඩව ජාතියට අයත් රාගයක මධ්‍යලය ගීතයේස්ථායිකොටස ස්වරප්‍රස්තාර කරන්න .(ල:4)

(2) |ම ම ප ධ |නි_නි_ස් - |රි ග_රි ස් |නි_ධ නි_ |යනුවෙන් අන්තරා කොටස ආරම්භ වන සර්ගමය සම්පූර්ණ කර ලියා රාගයේ නම සඳහන්කරන්න. (ල:4)

(3) නි රි ස, නි රි ග රි ස ................යන ස්වර අභ්‍යාසය අදාල ස්වර සංකේත සහිතව උච්ච සප්තකය දක්වා වර්ධනය කර ලියන්න. (ල:4)

03. මහනුවර යුගයේ රජ වාසල කවිකාර මඩුවෙන් ආරම්භවූ ගීත විශේෂයකි ප්‍රශස්ති හා හටන්.

(1)ප්‍රශස්ති ගීත පිලිබඳ හා හටන් ගීත පිළිබඳ විශේෂ ලක්ෂණ හතර බැගින්ලියන්න. (ල:8)

(2)සී ද එස් කුලතිලක මහතා විසින් රචිත නීලා වික්‍රමසිංහමහත්මිය ගායනා කරන නිර්දේශිත ජන ගී ආශ්‍රිත සරල ගීතයක පාද 8 ක් ලියන්න. (ල:4)

04. ශ්‍රී ලංකාවේ කණ්ඩායම් ගීත එක්තරා කාල වකවානුවක මෙරට රසිකයන්ගේජනාදරයට පාත්‍ර විය.

(1) එකල ජනප්‍රියත්වයට පත් සංගීත කණ්ඩායම් 4 ක් නම් කරන්න. (ල:4)

(2) කණ්ඩායම් සංගීතයේ දී දක්නට ලැබෙන සංගීතමය ලක්ෂණ 4 ක් කෙටියෙන් සඳහන් කරන්න. (ල:4)

(3) ජනප්‍රියත්වයට පත් ඔබ දන්නා කණ්ඩායම් ගීත 4 ක මුල් පාදය ලියා දක්වන්න.(ල:4)

05. (1)අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයේ දී කොටස් 4 කට බෙදා දක්වා ඇත. එම කොටස් 4 නම් කරන්න. (ල:4)

(2) ඔම කොටස් 4 අතරින් කොටස් දෙකකට අයත් භාණ්ඩ යුගලය බැගින සඳහන කරන්න. (කොටස් 2 හා භාණ්ඩ යුගලය නම් කරන්න) (ල:4)

(3) තැලීමෙන්හඬ ඉපිද විය හැකි ස්වර වාද්‍ය භාණ්ඩ 2ක් හා තාල වාද්‍ය භාණ්ඩ 2 ක් නම්කරන්න. (ල:4)

06. (1)තත් වාද්‍ය භාණ්ඩ 4 ක් නම් කරන්න. (ල:2)

(2)අපරදිග සංගීතයටඅයත් තත් 4 කින් යුත් සංගීත භාණ්ඩයක දළ රූප සටහනක ඇඳ කොටස් 4 ක් නම් කරන්න. (ල:6)

(3)තත් 6 කින්යුත් සංගීත භාණ්ඩයක් නම් කර එම භාණ්ඩය සුසර කරන අයුරු රූප සටහනක් මගින් දක්වන්න. (ල:4)

07. (1)පහත සඳහන් බටහිර සංගීත ප්‍රස්තාරයෙ පරදිග සංගීත ප්‍රස්තාරකරණයට අනුව ලියා දක්වන්න.




(ල:4)

(2)එම ප්‍රස්තාරම මධ්‍ය භාවයෙන් ලියන්න. (ල:2)

(3)F Major scale හා G major scale (ස්කේල)යේ ස්වර ආරෝහණ වශයෙන් ලියා දක්වන්න. (ල:2)

(4)පහත සඳහන් බටහිර සංගීත Notes නම් කර එහි වටිනාකම් ලියා දක්වන්න. (ල:2)

1) p 2) o 3) d · 4) o ·